සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම පළකෙරේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,671 - 2010 සැප්තැම්බර් මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2010.09.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1528 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1533 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 සැප්තැම්බර් මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 සැප්තැම්බර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තනතුරු - ඇබෑර්තු

## පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරු වලට බඳවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *බඳවා ගැනීමේ ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික) (රා.ප.ච. 6/2006 IV අනුව)* | *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | විදුලිකාර්මික | ශිල්පීය III | 01 | රු. 12,470 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු. 18,860 (පීඑල්3-2006ඒ) තුන්වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.) | (1) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 2කට සම්මාන සහිතව විෂයන් 6ක් සමත් විය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 5ක් සමත් විය යුතු ය.<br>(2) දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාල ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසැලකින් 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතු ය.<br>2009.05.12 වැනි දින වන විට විදුලි කාර්මික තනතුර සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළවේ.<br>*වෘත්තීය සුදුසුකම් :-*<br>(I) තනතුරේ කාර්යය භාරයට අදාලව තෘතීය අධ්‍යාපන කොමිසන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන N.V.Q. 4 මට්ටමේ සහතිකය ලබා තිබීම.<br>(II) පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 3ක පළපුරුද්දක් තිබිය යුතුය (සේවා සහතික මගින් සනාථ කල යුතුය.) |
| 02 | වැඩ පරිපාලක | අර්ධ ශිල්පීය III | 01 | රු. 12,210-10x130-10x145-12x170-රු. 18,600 (පීඑල් 2-2006ඒ) තුන්වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.) | *අධ්‍යාපන සුදුසුකම් :-*<br>(I) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් 02ක් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br>(II) දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය.<br>(III) 2009.05.12 වැනි දින වන විට ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළවේ.<br>*වෘත්තීය සුදුසුකම් :-*<br>(I) තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ N.V.Q 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබාතිබිය යුතු ය. |

| *අනු. අංකය* | *තනතුර* | *බඳවා ගැනීමේ ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික) රා.ප.ච. 6/2006 IV අනුව* | *අධ්‍යාපන සුදුසුකම් (සම්බන්ධිතයි)* |
|---|---|---|---|---|---|
| | | | | | (2) අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වසර 2 ක ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.) |
| 03. | ආදාහනාගාර භාරකරු | ශිල්පීය නොවන III | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160- රු. 17,600 (පී. එල්. 1-2006 ඒ) තුන්වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. | *අධ්‍යාපන සුදුසුකම් :-* (1) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02ක් සමත්වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර) (2) 2008.11.19 වැනි දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාල වේ. |
| 04. | ආදාහනාගාර කම්කරු | ශිල්පීය නොවන III | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160- රු. 17,600 (පී. එල්. 1-2006 ඒ) තුන්වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. | *අධ්‍යාපන සුදුසුකම් :-* (1) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02ක් සමත්වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර) (2) 2008.11.19 වැනි දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළවේ. |
| 05. | මාර්ග කම්කරු | ශිල්පීය නොවන III | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160- රු. 17,600 (පී. එල්. 1-2006 ඒ) තුන්වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. | *අධ්‍යාපන සුදුසුකම් :-* (1) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් 02ක් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) (2) 2008.11.19 වැනි දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළවේ. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
(iii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය. (පදිංචිය වසමේ ග්‍රාම නිළධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සහතික කර තිබිය යුතු ය.)
(iv) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (එහෙත් දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
(v) ඉහත අංක 01 හා 02 තනතුර සඳහා දැනටමත් ප්‍රාථමික ශිල්පීය හා අර්ධ ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට, ඔවුන්ට පමණක් පෞද්ගලික වනසේ උපරිම වයස් සීමාවක් බල නොපැවැත්වේ.
(vi) අයදුම්කරුවන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
(vii) දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් ඔහු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 5ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර එකී පූර්වාසන්න වසර 5ක් තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

මෙම තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් පසු සුදුසුකම් ලත් අයදුම්කරුවන් අදාළ තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු දායක මුදල් ගෙවිය යුතු ය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් රාජ්‍ය සේවා කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥා පනත්/පනත් වල විධිවිධාන වලට ද, පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. :

*ඉල්ලුම්කළ යුතු ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2010.10.01 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව පොල්ගහවෙල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "................... තනතුර සඳහා අයදුම්පත" (තනතුරේ නම) යනුවෙන් සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, මුල්පිටපත් සම්මුඛ පරීක්‍ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය ;
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එකක් ග්‍රාම නිලධාරියාගෙන් විය යුතුය.);
5. පළපුරුද්ද පිළිබඳ සහතික අංක 01 සහ 02 තනතුරු සඳහා අවශ්‍ය ශිල්පීය නිපුණතා සහතිකය.

ජේ. ඒ. අජිත් කුමාරසිංහ,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පොල්ගහවෙල.

2010 ක්වූ අගෝස්තු මස 26 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව**

***වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2010***
***........................................................................................ තනතුර සඳහා අයදුම්පත***

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
03. ස්ථිර ලිපිනය :——————.
04. පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි කාලය :——————.
05. උපන් දිනය: වර්ෂය :——————., මාසය:——————., දිනය:——————.
06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : ——————. මාස :——————. දින:——————.
07. ජාතික හැඳුනුම්පත් අංකය :____________.
08. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————.
09. විවාහක/අවිවාහක බව:——————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන් ද? :——————.
11. අධ්‍යාපන සුදුසුකම් :- සමත්වූ විභාග පිළිබඳ විස්තර :——————.
(සහතික වල ඡායා පිටපත් අමුණන්න)
12. වෘත්තීය සුදුසුකම්: (සහතික මගින් සනාථ කළ යුතුය.) : ——————.
13. සේවා පළපුරුද්ද : ——————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? : ——————.
15. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය පිළිබඳ විස්තර : ——————.

එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/තාවකාලික) : ——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසුව ඒ බව හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද මම දනිමි.

__________
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්කරු වන ....................................... මයා./මිය./මෙනවිය දැනට මෙම ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය මොනම ආකාරයෙන් හෝ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 5 තුළදී විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද, එකී පූර්වාසන්න වසර 5 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බව ද මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

__________.
දෙපාර්තමේන්තුව/ආයතනයේ හෝ බලය
පවරනු ලබන නිලධාරියාගේ අත්සන.

නම : ——————.
පදවි නාමය : ——————.
දෙපාර්තමේන්තුව : ——————.
දිනය : ——————.

09-608

---

## පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ, පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2010.09.30 වැනි දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය හා වැටුප් ක්‍රමය* | *තනතුරු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 01. බර වාහන ක්‍රියාකරු III ශ්‍රේණිය (PL-3-2006ඒ ) රු.12,470-10x130-10x145-10x160-12x170-රු.18,860 | 01 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 06ක් සමත් ව විෂයයන් දෙකකට සම්මාන ලබා තිබීම. |
| 02. මාර්ග කම්කරු III ශ්‍රේණිය (PL-3-2006ඒ ) රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 | 02 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් 02ක් සමත් විය යුතුයි. |

01. *පොදු සුදුසුකම්* -

01. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
02. යහපත් චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
03. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.
04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න අවුරුදු 3ක් තුල පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි අය විය යුතු ය.
05. අයදුම්කරුවන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූ අයෙකු නොවිය යුතු ය.

02. *ශිල්පීය නිපුණතා* - බර වාහන ක්‍රියාකරු තනතුර සඳහා පහත සඳහන් ශිල්පීය නිපුනතා අවශ්‍යවේ.

01. ඒ ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.
02. වසර 05ක වාහන රියදුරකු ලෙස සේවය කර ඇති බව සනාථ කිරීම සඳහා සහතික
03. බර වාහන ක්‍රියා කරවීම සම්බන්ධව ලබාගත් අයි. ටී. ඒ. ටී. සහතිකය

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි ඃ*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
02. ස්ථිර පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
03. බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය/වයඹ පළාත් සභාව විසින් ප්‍රකාශයට පත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය ඃ-*

01. අවශ්‍යතාවය අනුව ලිඛිත/සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
02. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
03. දැනටමත් පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු වූවන් පිළිබඳව වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

05. *අයදුම් කිරීමේ පිළිවෙල ඃ-*

01. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ අයදුම්පත් 2010.09.30 දින හෝ ඊට පෙර ලැබෙනසේ "ලේකම්, පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව, හෙට්ටිපොල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවිය යුතු ය.
02. අයදුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ඉල්ලුම්කරන තනතුර " සම්පූර්ණයෙන් සඳහන් කළ යුතු ය.
03. අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා තිබිය යුතුය.
    (i) උප්පැන්න සහතිකය,
    (ii) අධ්‍යාපන සහතික,
    (iii) පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
    (iv) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරි වරයාගෙන් ලබාගත් එකක් විය යුතු ය.)
    (v) ශිල්පීය නිපුණතා සනාථ කිරීමේ සහතික.

අයදුම්පත්‍ර කැඳවීමෙන් පසු හෝ කැඳවන අතුරතුරකදී මෙම බඳවා ගැනීම අත්හිටුවීම, ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ආර්. එම්. ධර්මසේන,
ලේකම්,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

2010 අගෝස්තු මස 23 වැනි දින,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ**
**................................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :——————————.
    (මුලකුරුවලින් හැඳින්වෙන නම්) :——————————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
03. ස්ථිර ලිපිනය:——————————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
05. උපන් දිනය:
    වර්ෂය:——————————, මාසය:——————————, දිනය:——————————.
06. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ?/ලියාපදිංචි වීමෙන් ද?:——————————.
07. අධ්‍යාපන සුදුසුකම් :
    (i) අ.පො.ස. /(සා.පෙළ) විභාගය
    සමත් වර්ෂය:——————————. හා විභාග අංකය:——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *01.* | | *06.* | |
| *02.* | | *07.* | |
| *03.* | | *08.* | |
| *04.* | | *09.* | |
| *05.* | | *10.* | |

    (ii) වෙනත් සුදුසුකම්:——————————.
08. වෘත්තීය සුදුසුකම්:——————————.
09. සේවා පළපුරුද්ද ඃ
    (i) දැනට සේවය කරන ආයතනය:——————————.

(ii) දැනට දරන තනතුර :——————————.
(iii) එම තනතුරට පත් වූ දිනය:——————————.
(iv) පෙර සේවය කළ ස්ථානය හා දරන ලද තනතුර:——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මෙහි සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසුව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————

අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා./මිය./මෙනවිය දැනට මෙම ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය මොනම ආකාරයෙන් හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————.

ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතනය : ——————.
නම : ——————.
පදවිය : ——————.
දිනය : ——————.

09-309

---

# පළාත් පාලන නිවේදන

## මාතර මහ නගර සභාව

### 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙකී පහත උපලේඛනයේ සඳහන් තැනැත්තන් විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාවලට එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2011 වර්ෂයට බලපත්‍ර ලබා ගැනීමට මා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනතේ (6) වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලා අසල හෝ එකී සමාජ ශාලා සඳහා අපේක්ෂිත ස්ථානය අසළ හෝ පදිංචි යම් තැනැත්තෙකු එම ක්‍රීඩා සමාජ ශාලා සඳහා බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන්නේ නම් එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති 04ක් ඇතුළත තමාගේ විරුද්ධත්වයට හේතු ලිඛිතව පිටපත් 02කින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මාතර මහ නගර සභාව.

2010 අගෝස්තු මස 05 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාල යේ දී ය.

(උපලේඛනය පහත දැක්වේ)

*උපලේඛනය*

| | *ඉල්ලුම්කරුගේ නම* | *සමාජ ශාලාවේ ලේකම්/සභාපති/ කළමනාකරු* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යන ස්ථානය* |
|---|---|---|---|---|
| 01. | ඩබ්. ඒ. මොහාන් නලින් කුමාර දහම්ප්‍රිය අංක 04, කම්ල් පටුමග නූපේ, මාතර. | ලේකම් | චිත්‍රා ක්‍රීඩා සමාජය | අංක 05, මැදගොඩ, මාතර. |
| 02. | එම්. පී. හර්බි අංක 04, ළිඳ පාර, පල්ලිමුල්ල, මාතර. | සභාපති | නිල්වලා ක්‍රීඩා සමාජය | අංක 392, පල්ලිමුල්ල, මාතර. |

09-607

**බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 දක්වා වූ වගන්ති වලින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2(3) වගන්තියෙන් පනවා ගැනීමට ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර බලය ලැබෙන්නා වූ ද, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙන් පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ද අනුව ඔහු විසින් සම්පාදනය කර අංක 520/7 හා 1988.08.23 දින දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වු ද, දකුණු පළාත් සභාව විසින් අනුමත කර, ඒ බව අංක 648 හා 1991.02.01 වැනි දින දරන *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් පිළිගනු ලැබුවාවූ ද, සම්මත අතුරු ව්‍යවස්ථා 01 සිට 42 දක්වා කාණ්ඩ මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දින සිට වලංගු වන සේ පිළිගැනීමට බලපිටිය ප්‍රාදේශීය සභාවේ 2009 ජූලි මස 21 වැනි දින පැවැත්වු සභා රැස්වීමේදී සම්මත වූ යෝජනාවක් මගින් තීරණය වී ඇති බව මෙයින් නිවේදනය කරමි.

එම්. ඩබ්. සුනිල් විජේරත්න ද සිල්වා,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
බලපිටිය.

2009 ක් වූ ඔක්තෝබර් මස 27 වැනි දින,
බලපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-228

---

**මිහින්තලේ ප්‍රාදේශීය සභාව - 2011 වරිපනම් බදු පැනවීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මිහින්තලේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2010 වර්ෂයේ ජූලි මස 22 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දි ගරු මන්ත්‍රි අනුර ජේ මැන්දිස් මහතාගේ යෝජනාවෙන් හා ගරු මන්ත්‍රි අනිල් පුෂ්පානන්ද මහතාගේ ස්ථිරත්වයෙන් පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

දේශබන්ධු ඩබ්. හේමරත්න,
සභාපති,
මිහින්තලේ ප්‍රාදේශීය සභාව.

2010 ජූලි මස 30 වැනි දින,
මිහින්තලේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*01. යෝජනාව :*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර මිහින්තලේ ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද සෑම ප්‍රදේශයකම පිහිටි සෑම නිශ්චල දේපලකම 2011 වර්ෂයේ සිට වාර්ෂික වටිනාකම පිළිගෙන ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

*02. යෝජනාව :*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා 134(2) වැනි වගන්ති යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පහත සඳහන් දියුණු කළ ප්‍රදේශවලින් වරිපනම් බදු අය කිරීමටත්, සෑම නිශ්චල දේපලකම වාර්ෂික තක්සේරු වටිනාකමින් 4%ක වරිපනමක් 2011 වර්ෂයේ සිට පනවා අයකර ගත යුතු බව ද, මිහින්තලේ ප්‍රාදේශීය සභාව වෙත වරිපනම් ගෙවන, වරිපනමක් ගෙවීමට යටත් සෑම තැනැත්තෙකු විසින් ම යතෝක්ත වරිපනම් 2011 වර්ෂයේ මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික හතරකින් (04) ගෙවනු ලැබිය යුතු යැයි විධානය කිරීමට යෝජනා කරමි.

(අ) 2011 වර්ෂයට ගෙවිය යුතු වරිපනම් 2011 ජනවාරි මස 31 දිනට හෝ ඊට පෙර ගෙවනු ලබන්නේ නම් 10% වට්ටමක් ද, එම වරිපනම් කාර්තු වශයෙන් ගෙවන්නේ නම් අදාළ කාර්තුවේ පළමු මස ඇතුලත ගෙවනු ලබන්නේ නම් 5%ක වට්ටමක් ද, ලබාදෙනු ලබන බව ප්‍රාදේශීය සභා පනතේ 134(7) වැනි වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

(ආ) නියමිත දිනට බදු නොගෙවන විට අයවිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් 15% (සියයට පහලවක්) වශයෙන් දඩ මුදලක් අයකරනු ලැබේ.

* මාතලේ හන්දිය සිට අඹගහවෙල දක්වා ප්‍රධාන මාර්ග දෙපස සිට මීටර් 200ක් දුර ප්‍රමාණය (ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ප්‍රදේශය)
* ඒ-09 මාර්ගයේ තිරප්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාවේ සිට රඹෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව දක්වා (නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කොටස හැර) ප්‍රධාන මාර්ගය දෙපස මීටර් 200ක් දුර ප්‍රමාණය
* කදුවටා මාර්ගය (බර්ට් ප්‍රේමලාල් දිසානායක මාවත) දෙපස මීටර් 200ක් දුර ප්‍රමාණය
* මහින්ද රාජපක්ෂ මාවත දෙසප මීටර් 200ක් දුර ප්‍රමාණය
* ඉසුරු උයන (කාර්මික පෙදෙස)
* මහකනදරාව වැවට යන පාර දෙපස මීටර් 200ක් දුර ප්‍රමාණය
* කටුකැලියාව නගරය
* සීප්පුකුලම නගරය
* මාතලේ හන්දිය නුවර පාර මිහින්තලේ ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රදේශයේ මීටර් 200ක් දුර ප්‍රමාණය
* සීප්පුකුලම ගලෙන්බිඳුණුවැව පාරේ දෙපස මීටර් 200ක් දුර ප්‍රමාණය (මිහින්තලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කොටස පමණි.)

09-229

---

**බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව**

බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පොදු මංමාවත් ප්‍රකාශයට පත් කිරීම

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් උපලේඛනයේ විස්තර වන පොදු මංමාවත් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරණු ලබන බැවි, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තිය ප්‍රකාරව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

දේශබන්ධු එල්. ඩබ්ලිව්. චමින්ද විජේසිරි,
සභාපති,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව.

2010 ක් වූ අගෝස්තු මස 18 වැනි දින,
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

*පොදු මංමාවත් පිළිබඳ විස්තරය*

| *මාර්ගයේ නම* | *පිහිටීම* | *දිග (මීටර්)* | *පළල (මීටර්)* |
|---|---|---|---|
| ඕබඩ ඇල්ල ග්‍රාම නිළධාරි කොට්ඨාසය 67 F : | | | |
| අලවත්ත ගම් මැද්ද පිවිසුම් මාර්ගය | අලවත්ත සුසාන භූමිය අසළ සිට ඕබඩ ඇල්ල මාර්ගය දක්වා | 350 | 2..5 |
| අඹේගොඩ ග්‍රාම නිළධාරි කොට්ඨාසය 67 C : | | | |
| ගිණිගත්හේන පතන අතුරු මාර්ගය | වැලිමඩ මාර්ගයේ සිරිසඟබෝ ළමා නිවාසය අසළ සිට ගිණිගත්හේන පතන 1 පටුමග දක්වා අතුරු මාර්ගය සමග ගිණිගත්හේන පතන හරහා වැලිමඩ මාර්ගය දක්වා | 485 | 2.1 |
| උඩපේරුව ග්‍රාම නිළධාරි කොට්ඨාසය 66 B : | | | |
| උඩපේරුව කෝවුවත්ත මාර්ගය | හීල්ඔය මාර්ගයේ සිට භාවනා මධ්‍යස්ථානය අසළ ඇළ දක්වා | 900 | 5 |
| කොන්තෙහෙළ ග්‍රාම නිළධාරි කොට්ඨාසය 67 A : | | | |
| අනුර සුමේධ මාවත | පනංගල බෝකොටුව සිට පල්ලෙවෙල මාර්ගය දක්වා | 200 | 6 |

09-310

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.